කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් - 2015 / 2016
---------------------------------------------------

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමේ ("සමාගම") 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනයේදී ප්‍රසිද්ධ වෘත්තියේ නියැලුණු වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා විසින් ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා සහ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත්කර ඇති බවත්ය.

**2.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

---

**2.3.1** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 04 වන වගන්තිය | සමාගම මගින් දළ වැටුප් ප්‍රමාණය මත පමණක් උපයන විට ගෙවීමේ බද්ද (PAYE) අඩු කර ඇති අතර දුරකථන සහ සමාගමේ ධාරිතාව මත සේවකයින් ලබා ගන්නා වෙනත් නිත්‍ය ලාභ වැනි වෙනත් දීමනා පිළිබඳව සලකා බලා නොතිබුණි. |
| (ආ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | සමාගම විසින් කාර්තුමය පදනමින් ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

**3.** මූල්‍ය සමාලෝචනය

---

**3.1** මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගම බදු පෙර ශුද්ධ ලාභය වශයෙන් රු.2,398,667 ක් වාර්තා කර ඇති අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී බදු පෙර ශුද්ධ අලාභය රු.10,848,557 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,247,224 ක වර්ධනයක් දක්නට ලැබුණි. ක්ෂය පිරිවැය සියයට 63 කින් අඩුවීම, ආයතනික හා පරිපාලන පිරිවැය සියයට 65 කින් සහ මූල්‍ය හා අනෙකුත් පිරිවැය සියයට 76 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ සිදු වූ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

**(අ) වැදගත් ගිණුම්කරණ අනුපාත**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පූර්ව වර්ෂය හා සසඳා පහත දක්වා ඇත.

| අනුපාතය | 2015/2016 | 2014/2015 |
|---|---|---|
| ජංගම අනුපාතය | 6.3:1 | 4.7:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.3:1 | 0.74:1 |
| දළ ලාභ අනුපාතය | 40.44% | 45.83% |
| ශුද්ධ ලාභ අනුපාතය (බදු පසු) | 1.16% | -8.88% |

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ජංගම වත්කම් අනුපාතය 6.3 ක් විය. කෙසේ වුවද, ජංගම වත්කම්වලින් සියයට 79 මගින් සමාගමේ තොග නියෝජනය වන බැවින් ක්ෂණික වත්කම් අනුපාතය 1.3 ක් විය.

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය පූර්ව වර්ෂයට සාපේක්ෂව සියයට 5 කින් අඩු වී ඇත. කෙසේ වෙතත්, මෙහෙයුම් පිරිවැය අඩුවීම හේතුවෙන් ශුද්ධ ලාභ අනුපාතය සියයට 10 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අයවැය පාලනය

සමාගමේ ව්‍යාපාරික අරමුණු වන්නේ උසස් සංශුද්ධතාවයෙන් යුත් ගුණාත්මක මිනිරන් අපනයනය සඳහා, මිනිරන් කැණීම සහ සැකසීම, සහ උපරිම වශයෙන් අගය එකතු කිරීම සහ මිනිරන් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීමයි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැයගත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 900 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය නිෂ්පාදනය වූයේ මෙට්‍රික් ටොන් 771.48 ක් පමණි.

(ආ) වාර්ෂික විකුණුම් ඉලක්කය මෙට්‍රික් ටොන් 750 ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය විකුණුම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 558.62 ක් පමණක් වූ අතර අයවැයගත විකුණුම් ආදායම රු. මිලියන 154.3 ක් වූ අතර තථ්‍ය විකුණුම් ආදායම රු. මිලියන 109 ක් විය.

අයවැයගත සහ තථ්‍ය විකුණුම් සංඛ්‍යා අතර සියයට 29 ක විචලනයක් නිරීක්ෂණය විය.

**4.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදී.

(අ) පතල්වලින් ඉවත් කරනු ලබන පළමු අවස්ථාවේදීම මිනිරන් මැනීමේ ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. එම නිසා, පොත් ශේෂය සහ මිනිරන් තොගයේ භෞතික ශේෂය මෙට්‍රික් ටොන් 174.33 කින් වෙනස් විය. 2016 මාර්තු 31 දිනට භෞතික මිනිරන් තොගය මෙට්‍රික් ටොන් 600.15 ක් වූ අතර පොත් ශේෂය මෙට්‍රික් ටොන් 774.48 ක් වූ අතර එම වෙනස සාමාන්‍ය මිනිරන් අපතේ යෑමක් වශයෙන් සලකා තිබුණි.

(ආ) භූගත ජලය පොම්ප කිරීම සඳහා අමතර ජල මෝටර නොමැති වීම, නිෂ්පාදන ධාරිතාව අඩාල වීමට හේතු වී තිබුණි.

**4.3** විශ්‍රාම ප්‍රතිලාභ සඳහා අරමුදලක් ගොඩනැඟීම

---

2016 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. 8,762,764 ක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, රුපියල් 6,762,764 ක් වන අනාගත වගකීම් ගෙවීම සඳහා වෙනම අරමුදලක් ස්ථාපනය කර නොතිබුණි.

**5.** පද්ධති සහ පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති සහ පාලන දුර්වලතා සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) තොග පාලනය | • මිනිරන් තොගය මැනීමට කිසිදු යතාර්ථනිරූපිත ක්‍රමයක් නොතිබුණි.<br>• ආරම්භක මිනුම් අවස්ථාවේ දී, මිනිරන් සහ ගල් වෙන් කිරීම සඳහා පිළිගත් සම්මතයක් නොතිබුණි.<br>• ගබඩාවල වාර්තා නිසි ලෙස යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) වත්කම් කළමනාකරණය | • සමාගම මෙහෙයුම් නොවන වත්කම් භාවිත කිරීමට පියවර ගෙන නොතිබුණි. |